කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදී
Issued by Forecasting Division, National Meteorological Centre.

**2021 නොවැම්බර් මස 11 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2021 නොවැම්බර් මස 11 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදී.**

**ගිණිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය මේ වනවිට පීඩන අවපාතයක් දක්වා වර්ධනයවී පේදුරු තුඩුවේ සිට කිලෝමීටර 250ක් පමණ උතුරු දෙසින් (උතුරු අක්ෂාංශ 11.7ත් නැගෙනහිර දේශාංශ 81.6ත් ආසන්න ප්‍රදේශයේ) පවතී. එය වයඹ දෙසට ගමන් කර අද දින සවස් කාලයේ උතුරු තමිල්නාඩු වෙරළට ලඟාවේ යැයි අපේක්ෂා කරයි.**

දිවයිනේ පැවති තද වැසි තත්ත්වයේ සාපේක්ෂව අඩුවීමක් අද දින සිට බලාපොරොත්තුවේ.

බස්නාහිර, සබරගමුව, වයඹ සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇතිවේ. උතුරු මැද පළාතේ වැසි ස්වල්පයක් ඇතිවිය හැක.

ඌව පළාතෙත් අම්පාර සහ මඩකළපුව දිස්ත්‍රික්කවලත් ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වල ඇතැම් ස්ථානවලට මි.මී. 50 ට වැඩි තරමක තද වැසි ඇතිවිය හැක.

දිවයින හරහා විටින් විට හමන පැ.කි.මී. (40-50) පමණ තද සුළං ඇතිවිය හැක.

**WEATHER FORECAST FOR 11 NOVEMBER 2021**
**Issued at 05.30 a.m. on 11 November 2021**

**The low pressure area in the south-east Bay of Bengal has intensified into a depression and located about 250 km north of Point Pedro (11.7N and 81.6E). It is expected to move northwestwards and reach the northern Tamil Nadu coast this evening.**

Showery weather over the island is expected to reduce from today.

Showers will occur at times in Western, Sabaragamuwa, North-western and Central provinces and in Galle and Matara districts. A few showers may occur in the North-central province.

Showers or thundershowers may occur at few places in Uva province and in Ampara and Batticaloa districts in the evening or night.

Fairly heavy showers above 50mm can be expected at some places in Western, Sabaragamuwa, Central and North-western provinces.

Strong winds up to (40-50) kmph can be expected over the island.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

# WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2021 නොවැම්බර් මස 11 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

ගිණිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය මේ වනවිට පීඩන අවපාතයක් දක්වා වර්ධනයවී පේදුරු තුඩුවේ සිට කිලෝමීටර 250ක් පමණ උතුරු දෙසින් (උතුරු අක්ෂාංශ 11.7ත් නැගෙනහිර දේශාංශ 81.6ත් ආසන්න ප්‍රදේශයේ) පවතී. එය වයඹ දෙසට ගමන් කර අද දින සවස් කාලයේ උතුරු තමිල්නාඩු වෙරළට ලඟාවේ යැයි අපේක්ෂා කරයි.

එබැවින් දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවලත් නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේත් අද දින සවස් කාලය වනතුරු ධීවර සහ නාවුක කටයුතු වලින් වැලකී සිටින ලෙස දැනුම් දෙනු ලබන අතර ඉදිරි කාලගුණ නිවේදන කෙරෙහි අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**වැසි තත්ත්වය:**

කන්කසන්තුරය සිට පුත්තලම, කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා වන දිශා වලින් දෙසින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (55-65) පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 05.30 a.m. on 11 November 2021**

**The low pressure area in the south-east Bay of Bengal has intensified into a depression and located about 250 km north of Point Pedro (11.7N and 81.6E). It is expected to move northwestwards and reach the northern Tamil Nadu coast this evening.**

**Naval and fishing communities are advised not to venture the aforementioned sea area and sea areas around the island until this evening. They are requested to be attentive in future weather forecasts.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas extending from Kankasanturai to Hambantota via Puttalam, Colombo and Galle. Showers or thundershowers will occur at several places in the other sea areas around the island.

**Winds:**

Winds will be Westerly to South-westerly and speed will be (30-40) kmph in the sea areas around the island. Wind speed can increase up to **(55-65) kmph** at times in the sea areas around the island.

**State of Sea:**

The sea areas around the island will be rough at times.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**